සැ. ය. — 1996.03.08 දින අංක 914 දරන ගැසට් පත්‍රයේ III කොටස සහ IV (අ) කොටස පළ නොකරන ලදී.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
පොත් සහ මුද්‍රණ
රෙජිස්ට්‍රාර් කාර්යාලය
09 JUL 1996
ශ්‍රී ලංකා SRI LANKA ශ්‍රී ලංකා
264159

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 915 – 1996 මාර්තු 15 වැනි සිකුරාදා – 1996.03.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස–පළාත් සභා

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිටුව. |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... | 706 |
| තනතුරු – ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| කොටුපල්, රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* ගැසට් පත්‍රයෙහි සෑම කොටසකම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේදී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා, වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාද දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාද දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු – ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව – එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 1996 මාර්තු මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 1996 මාර්තු මස 08 වැනි දින දහවල් 12ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1996 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

705—B 077053—22,075 (96/03)

# පළාත් සභා නිවේදන

## මධ්‍යම පළාතේ පළාත් සභාව

මතු දැක්වෙන ප්‍රඥප්තිය, 1995 අගෝස්තු මස 25 වැනි දින පැවති මධ්‍යම පළාත් සභාවේ සභා රැස්වීමේ දී ඒකමතිකව සභා සම්මත වූ අතර, එයට 1996.02.10 දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

පී. ආර්. රණසිංහ,
සභා ලේකම්,
මධ්‍යම පළාත් සභාව.

1996ක් වූ පෙබරවාරි මස 20 වැනි දින,
මධ්‍යම පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. අංක 07,
පල්ලේකැලේ,
කුණ්ඩසාලේ

### මධ්‍යම පළාත් සභාවේ - 1995 අංක 02 දරන පුස්තකාල ප්‍රඥප්තිය

***මධ්‍යම පළාත් සභාව තුළ විධිමත් හා යහපත් පුස්තකාල සේවාවක් ඇති කරලීමත්, එමගින් පොදු සමාජයේ ජන කොටස්වල දැනුම හා තොරතුරු ලබාදීමට සහායවීමත්, විශේෂයෙන්ම මධ්‍යම පළාතේ ජන කොටස්වල සංවර්ධනය සඳහා දැනුම සහ තොරතුරු ලබාදීම හා මධ්‍යම පළාතේ සංවර්ධන කටයුතුවලට තොරතුරු සේවාව පිළිබඳව ක්‍රියාත්මක වශයෙන් සහභාගී වීමත් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

1. මේ ප්‍රඥප්තිය මධ්‍යම පළාත් සභාවේ 1995 අංක 02 දරන පුස්කාල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මධ්‍යම පළාතේ ආණ්ඩුකාරතුමා විසින් සහතික කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

2. මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කෙරෙන මහජන පුස්තකාල, අධ්‍යාපන පුස්තකාල සහ විශේෂ පුස්තකාල කටයුතු සැළසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම ප්‍රධාන පරමාර්ථයයි. ඒ හැර පහත සඳහන් පරමාර්ථයන් ද මේ තුළින් ඉටු කිරීම අපේක්ෂා කෙරේ.

මධ්‍යම පළාතට යෝග්‍ය පුස්තකාල සැළැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, පුස්තකාල වෘත්තීය පුහුණුව සඳහා සැළැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, මූල්‍ය ප්‍රතිපාදන සළසාලීම සඳහා විධිවිධාන යෙදීම, කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සැළසුම් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, පුස්තකාල කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි, විභාග පරිපාටි සකස් කිරීම.

පුස්තකාල සහයෝගිතා ක්‍රම ඇති කිරීම තුළින් සම්පත් බෙදා හදා ගැනීම, පළාත් බද තොරතුරු ජාල සකස් කිරීම, අන්තර් පුස්තකාල හුවමාරු ක්‍රම සහ පිරුළු ක්‍රම ඇති කිරීම සහ ජංගම පුස්තකාල සේවා ඇති කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දීම හා විධිවිධාන යෙදීම, ප්‍රකාශන පළ කිරීම, පරිවර්තන සේවා සැපයීම, පුස්තකාල සේවා සංවර්ධනය සහ ජාතික තොරතුරු අවශ්‍යතාවයන් හඳුනා ගැනීම පිළිබඳ පර්යේෂණ කිරීම, සංඛ්‍යාලේඛන සහ තොරතුරු එක්රැස් කිරීම, පුහුණු පාඨමාලා පැවැත්වීම මධ්‍යගත තාක්ෂණික සේවා ඇති කිරීම සඳහා විධිවිධාන යෙදීම.

දැනට පවත්වා ගෙන යන පුස්තකාල පිළිබඳ අධ්‍යයනය කිරීම තුළින් අදාල පුස්තකාල සංවර්ධනය සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

පාඨකයින්ට පුස්තකාලවලින් උපරිම සේවාවක් ලබා ගැනීම සඳහා පුස්තකාල පරිපාලනය පිළිබඳ දැනුම ලබා දීම, දැනුම හුවමාරු කිරීමේ පුස්තකාල සහයෝගිතා වැඩ සටහන් (ක්‍රියාත්මක කිරීම, ප්‍රදේශයේ සංස්කෘතිය පිළිබිඹුවන පොත්, අත් පිටපත්, පුස්තකාල පොත් ආදී සාහිත්‍යමය උරුමයන් පුස්තකාලවලට අයත් කර ගැනීම හා සංරක්ෂණය පිළිබඳ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම, සාකච්ඡා, සම්මන්ත්‍රණ පැන විසඳුම්, තරග, කථික තරග, ආරාධිත උගතුන්ගේ දේශණ ආදී සංවිධානාත්මක ක්‍රියා තුළින් පුස්තකාල සමාජ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කරන ක්‍රියාත්මක ආයතන බවට පත් කිරීම සහ ප්‍රජා තොරතුරු සේවාවන් සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් බවට පුස්තකාල පත් කිරීම.

පළාත් පාලන ආයතන ඇතුළු අනෙකුත් ආයතන හා සංවිධානවලට සහ පොදු ජනතාවට අවශ්‍ය තොරතුරු එක්රැස් කරන, සංවිධානය කරන, සහ බෙදා හරින තොරතුරු මධ්‍යස්ථානයක් බවට ද පුස්තකාල පත් කිරීම තුළින් මානව සම්පත් සංවර්ධනයට සහාය වීම.

264159
09 JUL 1996
ශ්‍රී ලංකා SRI LANKA ශ්‍රී ලංකා

3. මෙ ප්‍රඥප්තියෙහි දක්වා ඇති කාර්යයන් මෙ සඳහා මෙ ප්‍රඥප්තියෙන් මතු දැක්වෙන විධිවිධානවලට අනුකූලව, — පළාත් පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීම

(අ) පළාත් පුස්තකාල සේවා මණ්ඩලයක් ;

(ආ) දිසා පුස්තකාල සේවා මණ්ඩල තැනක් ;

(ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා පුස්තකාල සේවා මණ්ඩලයක්

බැගින් පිහිටුවනු ලැබිය හැකිය.

4. (i) මෙම ප්‍රඥප්තිය යටතේ පවරනු ලබන වගකීම් සහ කාර්යයන් යථා පරිදි ඉටු කිරීම් සඳහා අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, පරිපාලනමය කුසලතාව සහ පළපුරුද්ද ලත් අයෙක් පළාත් පුස්තාකාල අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කළ හැකිය. — පළාත් පුස්තකාල අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධරයන් පත් කිරීම

(ii) මෙම ප්‍රඥප්තිය යටතේ පවරනු ලබන වගකීම් හා කාර්යයන් ඉටු කිරීම සහ සම්බන්ධීකරණය සඳහා කලින් කලට අවශ්‍ය විය හැකි නිලධාරීන් සහ සේවක මණ්ඩල පත් කරනු ලැබිය හැකිය.

(iii) මෙම වගන්තිය (i) සහ (ii) වැනි උප වගන්ති යටතේ පත් කරනු ලබන සියළුම නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් ලෙස සළකනු ලැබිය යුතුය.

(iv) මෙම ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කරන යම් රාජ්‍ය නිලධාරියෙකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් පවරනු නොලැබිය යුතුය.

(v) මෙම වගන්තිය යටතේ පත් කරන ලද සියළු නිලධරයන් විසින් තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ තම වගකීම් හා කාර්යයන් ඉටු කිරීමේ දී අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ හෝ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

## I වැනි කොටස

### *පළාත් පුස්තකාල සේවා මණ්ඩලය, දිසා පුස්තකාල සේවා මණ්ඩල සහ ප්‍රාදේශීය පුස්තකාල සේවා මණ්ඩල පිහිටුවීම*

5. (i) මධ්‍යම පළාතේ පුස්තකාල සේවා සහ තොරතුරු සේවාවන් පිළිබඳ කටයුතු සැළසුම් කරණය, සංවර්ධනය, සම්බන්ධීකරණය ආදී කාර්යයන් පිළිබඳ කරුණු, සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා මින් මතු " මණ්ඩලය " යනුවෙන් සඳහන් කරනු ලබන " පළාත් පුස්තකාල සේවා මණ්ඩලය " යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය හැකිය. — මධ්‍යම පළාතේ පුස්තකාල සේවා මණ්ඩල පිහිටුවීම

මෙම උපදෙස් ක්‍රියාත්මක කිරීමට පෙර අමාත්‍යවරයා විසින් පළාත් සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

(ii) ඒ මණ්ඩලය :–

(අ) ලේකම්, පළාත් පාලන,

(ආ) ලේකම්, අධ්‍යාපන,

(ඇ) පළාත් පාලන කොමසාරිස්,

(ඈ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

(ඉ) ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම්කරනු ලබන නියෝජිතයෙක්,

(ඊ) සභාපති, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්,

(උ) පුස්තාල පළාත් අධ්‍යක්ෂ,

(ඌ) පුස්තකාලයාධිපති, පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය පුස්තකාලය,

(එ) පුස්තකාලයාධිපති, පළාත් පුස්තකාලය,

(ඒ) පළාත් පාලන ඇමතිවරයා විසින් පත් කරනු ලබන පුස්තකාල කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන උගතුන් තිදෙනෙකුගෙන්

සමන්විත වේ.

(iii) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඉහත සාමාජිකයින් ගෙන් සුදුසු අයෙකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කළ යුතුය.

(iv) පළාත් පුස්තකාල අධ්‍යක්ෂ එම මණ්ඩලයේ ලේකම් ධූරය දැරිය යුතුය.

6. මණ්ඩලයේ වගකීම් සහ කාර්යභාරය නිශ්චය කිරීම සහ මණ්ඩලයේ රැස්වීම්වල ගණ පූර්ණය ආදිය මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය. — මණ්ඩලයේ වගකීම් හා කාර්ය භාරය සඳහා නියෝග හා රෙගුලාසි

7. මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වලට කටයුතු විධිමත් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සහ රෙගුලාසි සැදිය හැකිය.

දිසා පුස්තකාල සේවා මණ්ඩල පිහිටුවීම

8. (i) මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික්කවල පුස්තකාල සේවා සහ තොරතුරු සේවා නගා සිටුවීම, සංවර්ධනය කිරීම, උනන්දු කරවීම සහ පාලනය කිරීම සහ පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට නිර්දේශ කිරීම සහ සම්බන්ධීකරණයට අදාල කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම පිණිස, අමාත්‍ය වරයා විසින් නියමය කරනු ලැබිය හැකි එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා " දිසා පුස්තකාල සේවා මණ්ඩලය " බැගින් පිහිටුවනු ලැබිය හැකිය.

(ii) දිසා පුස්තකාල සේවා මණ්ඩලය පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය :—
(අ) දිස්ත්‍රික් ලේකම්,
(ආ) පළාත් පාලන සහකාර කොමසාරිස්,
(ඇ) නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,
(ඈ) නාගරික කොමසාරිස් (මහ නගර සභාව),
(ඉ) දිසා මධ්‍ය පුස්තකාලයාධිපති,
(ඊ) සහකර පළාත් පාලන කොමසාරිස් / (ප්‍රජා සංවර්ධන) / දිස්ත්‍රික් ප්‍රජා සංවර්ධන නිලධාරී,
(උ) සංස්කෘතික නිලධාරී,
(ඌ) පුස්තකාල කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන ඇමතිතුමා විසින් නම් කරනු ලබන උගතුන් තිදෙනෙක්.

(iii) අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන ඉහත සඳහන් සාමාජිකයින්ගෙන් සුදුසු අයෙකු සභාපතිවරයා ලෙස පත් කළ හැකිය.

(iv) දිසා මධ්‍ය පුස්තකාලයාධිපති කමිටුවේ ලේකම් විය යුතුය.

දිසා පුස්තකාල සේවා මණ්ඩලවල වගකීම් සහ කාර්ය භාරය

9. මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව දිසා පුස්තකාල සේවා මණ්ඩලයේ වගකීම් සහ කාර්ය භාරය සහ එම කමිටුවල රැස්වීම්වල සහපූර්ණය ආදිය ඇමතිවරයා විසින් නියෝග මඟින් නියම කරනු ලැබිය යුතුය.

දිසා පුස්තකාල සේවා මණ්ඩලවල නියෝග සහ රෙගුලාසි

10. සෑම දිසා පුස්තකාල සේවා මණ්ඩලයක් විසින්, ඒ කමිටුවේ රැස්වීම්වල කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා රීති සෑදිය හැකිය.

ප්‍රාදේශීය පුස්තකාල සේවා මණ්ඩල පිහිටුවීම

11. (i) මධ්‍යම පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පුස්තකල සේවා සහ තොරතුරු සේවා නගා සිටුවීමට, සංවර්ධන කිරීමට, උනන්දු කරවීමට සහ පාලනය කිරීමට අදාල වන කරුණු සම්බන්ධයෙන් සහ දිසා පුස්තකාල සේවා මණ්ඩලය සමග සම්බන්ධීකරණයට අදාල කරුණු සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍යවරයා විසින් නියමය කරනු ලබන ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා " ප්‍රාදේශීය පුස්තකාල සේවා මණ්ඩලයක් " පිහිටුවනු ලැබිය හැකිය.

(ii) එම කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය :—
(අ) අදාළ ප්‍රාදේශීය ලේකම් (සභාපති) ;
(ආ) අදාල පළාත් පාලන ආයතනයේ ලේකම් ;
(ඇ) පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ මධ්‍ය පුස්තකාලයාධිපති ;
(ඈ) ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ;
(ඉ) අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන මධ්‍ය මහ විදුහල්/ මහ විදුහල්/ පිරිවෙන්, විදුහල්පතිවරු තිදෙනෙක් ;
(ඊ) සංස්කෘතික නිලධාරී ;
(උ) ප්‍රජා සංවර්ධන නිලධාරී ;
(ඌ) සෑම පළාත් පාලන ආයතනයකින්ම නම්කරනු ලබන පුස්තකාලයාධිපතිවරුන් දෙදෙනෙක් ;
(එ) ඇමතිතුමා විසින් නම් කරනු ලබන පුස්තකාල කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන උගතුන් තිදෙනෙක් ;
(ඒ) ඇමතිතුමා විසින් පත් කරනු ලබන පාඨක සමාජයකට සම්බන්ධ සිසුන් දෙනෙනෙක්.

(iii) ප්‍රාදේශීය මධ්‍ය පුස්තකාලයාධිපති මෙම මණ්ඩලයේ ලේකම් විය යුතුය.

මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය

12. මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය, බලතල සහ යුතුකම් සහ රැස්වීම් සඳහා සණපූරණය මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට යටත්ව නියෝග මඟින් නියම කරනු ලැබිය යුතුය.

මණ්ඩලයේ නියෝග සහ රෙගුලාසි

13. මණ්ඩලයේ රැස්වීම්වල පරිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා ඒ මණ්ඩලය විසින් නියෝග සහ රෙගුලාසි සෑදිය හැකිය.

මණ්ඩලය සඳහා සාමාජිකයින් පත් කිරීමේ ධූර කාලය

14. (i) අමාත්‍යවරයා විසින් මණ්ඩලයට පත් කරනු ලබන සාමාජිකයින් මියයාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ කලින් ධූරය හිස් වුවහොත් මිස, තුන් අවුරුදු (03) කාල සීමාවක් දැරිය යුතුය.

(ii) මණ්ඩලයට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කිරීම අවශ්‍යතාවෝචිත බව අමාත්‍යවරයා සලකනහොත් හේතු දක්වා ඔහු විසින් එය කළ හැකිය.

264159

(iii) මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධූරය හිස් වන යම් සාමාජිකයෙකු වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙකු එසේ හිස්වූ ධූරය දැරූ සාමාජිකයාගේ ධූර කාලයෙහි ගත නොවී ඉක්මවා ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

(iv) කාලය ඉකුත්වීමෙන් ධූරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය.

15. යම් තැනැත්තෙකු - නුසුදුසුකම්

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තෙකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ආ) නිසි බලයක් ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ඇ) පොත්, වාර සඟරා, පුවත්පත් වැනි පුස්තකාල හා තොරතුරු සේවයට අදාල උපකරණ හා ද්‍රව්‍ය සැපයීමෙහි කොටස් එක්කර සැදීමෙහි, විකිණීමෙහි හෝ නිෂ්පාදනය කිරීමෙහිලා කෙලින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවයක් දරතහොත් ; හෝ

(ඈ) චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයක දී පසුගිය වසර පහක දී වරදකරු කරනු ලැබුවහොත් ; හෝ

(ඉ) සාපරාධී වරදකට වරදකරු වී තුන් මසකට නොඅඩු සිර දඬුවමක් ලැබීම හෝ එබඳු වරදකට රු. 5000ට වැඩි දඩයකට යටත්ව තිබීම ; හෝ

(ඊ) සාමාජිකත්වය ලබමින් සිටිය දී පාර්ලිමේන්තුවේ පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයක හෝ මන්ත්‍රීවරයෙකු වීම ; හෝ

(උ) හේතු නොදන්වා නොකඩවා මණ්ඩලයේ රැස්වීම් වාර තුනකට නොපැමිණීම

ඒ තැනැත්තා යම් පුස්තකාල සේවා මණ්ඩලයක සාමාජිකත්වය දැරීමට නුසුදුසු වන්නේ ය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ... රෙජිස්ට්‍රාර් කාර්යාලය
09 JUL 1996
ශ්‍රී ලංකා SRI LANKA ஸ்ரீ லங்கா

## II වැනි කොටස

### පළාත් පුස්තකාල පිහිටුවීම හා පරිපාලනය

16. මධ්‍යම පළාත් සභාව විසින් පුස්තකාල සඳහා වාර්ෂිකව ස්ථිර මුදල් ප්‍රතිපාදන වෙන් කළ හැකිය. පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ උපදෙස් අනුව අදාල ප්‍රමිතීන්ට අනුකූලව මෙකී මුදල් ප්‍රතිපාදන වාර්ෂිකව පුස්තකාලවලට සැපයිය හැකි වේ. මෙයට අමතරව විශේෂ මුදල් ප්‍රතිපාදන මධ්‍යම රජය විසින් ද සැපයිය හැකි වේ. සෑම පළාත් පාලන ආයතනයක්ම උපයා ගන්නා ලද ස්වයං උත්පාදන ආදායමින් අවම වශයෙන් 1% ක ප්‍රතිශතයක් පුස්තකාල සේවා සහ තොරතුරු සේවා සඳහා වෙන් කළ හැකිය. මුදල්

17. මධ්‍යම පළාතේ පුස්තකාල සේවා සහ තොරතුරු සේවා නගා සිටුවීම, සංවර්ධන කිරීම සහ උනන්දු කරවීම සඳහා මෙකී මින් මතු " අරමුදල " යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ " මධ්‍යම පළාතේ පුස්තකාල අරමුදල " යනුවෙන් හැඳින්වෙන්නා වූ අරමුදලක් පිහිටුවනු ලැබිය හැකිය. මධ්‍යම පළාත් පුස්තකාල අරමුදල පිහිටුවීම

18. (අ) රජය මගින් වරින් වර ආධාර වශයෙන් ප්‍රදානය කරනු ලැබිය හැකි මුදල් ; අරමුදලට ගෙවනු ලබන මුදල්

(ආ) පළාත් සභාව මගින් වාර්ෂිකව හෝ විශේෂ අවශ්‍යතා මත වෙන් කර දෙනු ලබන මුදල් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර කවර හෝ ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් මණ්ඩලය වෙත ලැබෙන සියළුම මුදල් ;

(ඈ) පළාත් පුස්තකාල මණ්ඩලය මගින් අනුමත කරන මූලාශ්‍රයකින් ලැබෙන මුදල්.

19. (i) ප්‍රඥප්තියේ විධි විධානවලට අනුකූලව එහි කාර්යයන් සඳහා යෙදීම පිණිස මණ්ඩලයේ නිර්දේශ මත මණ්ඩලය වෙනුවෙන් යම් චංචල හෝ නිශ්චල දේපල මිළ දී ගැනීමට ද පරිත්‍යාග වශයෙන් ලබාගැනීමට ද අවකාශ ඇත්තේ ය. මණ්ඩල හා නිශ්චල දේපල පරිත්‍යාග

(ii) එසේ ලැබෙන සියළුම මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

20. (i) අරමුදල අමාත්‍යවරයාගේ මෙහෙයවීමට හා අධීක්ෂණයට යටත්ව මණ්ඩලය විසින් පරිපාලනය කළ යුතුය. අරමුදලෙහි පරිපාලනය

(ii) මධ්‍යම පළාතේ පුස්තකාල සේවා මණ්ඩල අරමුදලේ පාලනය පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා අරමුදල් පාලන මණ්ඩලයක් අදාල අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

(iii) මණ්ඩලයේ මුදල් ලිත් වර්ෂකට විය යුතුය.

(iv) මණ්ඩලයේ ලැබීම් හා ගෙවීම්, වත්කම් සහ වගකීම් මණ්ඩලයෙන් වෙනත් සියළුම ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට සැළැස්විය යුතුය.

(v) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්තාවට අනුකූලව විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයකම මණ්ඩලයේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතුය.

(vi) මණ්ඩලය විසින් මණ්ඩලයේ වැඩ කටයුතු පිළිබඳව වාර්තාවක් වාර්ෂිකව පිළියෙල කරනු ලැබිය යුතු අතර, ඒ වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(vii) 1971 අංක 38 දරන මුදල් පනතෙහි II වැනි කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අරමුදලේ මුදල් පාලනය සහ ගණන් හිලව් සම්බන්ධයෙන් අදාල විය යුතුය.

අරමුදලෙන් කරනු ලබන ගෙවීම්

21. (i) අරමුදලේ පාලන මණ්ඩලය විසින් පළාත් පුස්තකාල සේවා මණ්ඩලය සමග නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයන් -

(අ) පුස්තකාල පොත්පත් හා උපකරණ ;

(ආ) පුස්තකාල ගොඩනැගිලි ;

(ඇ) පුස්තකාල කාර්ය මණ්ඩල සංවර්ධනය ;

(ඈ) මෙම ප්‍රඥප්තියේ පනවා ඇති විධිවිධානවලට අනුකූලව දැරිය යුතු වෙනත් සියළුම ගෙවීම්

අරමුදලෙන් ගෙවිය හැකිය.

(ii) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේදී හා යම් කාර්යයක් ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් කරන ලද යම් වියදමක් හෝ අවශ්‍ය සියළුම මුදල් ප්‍රමාණයන් මණ්ඩලයේ අරමුදලින් ගෙවිය හැක.

## III වැනි කොටස

### පුස්තකාල සේවා සහ තොරතුරු සේවා සඳහා පුහුණුවීම් සහ පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම

පුහුණුවීම් සහ පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම

22. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කාර්යයන් සඳහා මෙහි මින් මතු පුහුණුවීම්, පර්යේෂණ හෝ සේවා මධ්‍යස්ථාන යනුවෙන් සඳහන් කරනු ලබන ශිල්පායතන එකක් හෝ ගණනාවක් පිහිටුවනු ලැබිය හැකිය :—

(අ) පුස්තකාල සහ තොරතුරු සේවා අධ්‍යයනය පිළිබඳ දැනුම, උපදෙස් හා පුහුණුව ලබාදීම හා එම ශිල්පායතනවල ශිෂ්‍යයින් විසින් ලබා ඇති ප්‍රවීණතාවය නිශ්චය කිරීම සඳහා විභාග පැවැත්වීම; සහ

(ආ) එම ශිල්පායතන විසින් පවත්වනු ලබන විභාගවලින් සමත්වන අයට සහතික පත් ප්‍රදානය කිරීම.

පුහුණු මධ්‍යස්ථානවලට බඳවා ගැනීමේ පරිපාටි සහ වෙනත් කරුණු

23. අමාත්‍යවරයා විසින් නියෝග මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්තියට අනුකූලව-

(අ) බඳවා ගැනීමේ පරිපාටි ;

(ආ) අධ්‍යාපන, පුහුණුව හා විභාග පිළිබඳ පරිපාටි ;

(ඇ) අවශ්‍ය විය හැකි පරිදි ඒ ආයතනවලට අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්, ගුරුවරුන්, උපදේශකයන් සහ වෙනත් නිලධරයන් පත් කිරීම සහ ඔවුනට වැටුප් ගෙවීම පිළිබඳව පරිපාටි නියම කරනු ලැබිය හැකිය.

ශිල්පායතන පහසුකම් සැළසීම, විනය, පාලනය ආදිය සඳහා අමාත්‍යවරයා සතු බලතල.

24. අමාත්‍යවරයාට -

(අ) මෙම පහසුකම් සැපයීම සහ පුහුණුව නේවාසික පහසුකම් සහ වෙනත් කාර්යයන් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම, ඒවා නඩත්තු කිරීම සහ උපකරණ සැපයීම සඳහා ද ;

(ආ) ශිෂ්‍යයින්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ විනය සහ සුභ සාධනය ඇති කිරීම සහ විධිමත් කිරීම සඳහා ද ;

(ඇ) මෙම ආයතන මගින් සහතික පත් ප්‍රදානය කිරීමට විධිවිධාන සැළසීමට ද

බලය තිබිය යුතුය.

## IV වැනි කොටස

### පොදු විධිවිධාන

අමාත්‍යවරයාගේ සාමාන්‍ය හා විශේෂ විධිවිධාන

25. (i) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩලවල කමිටුවල, සංගම්වල හෝ වෙනත් සංවිධානවල බලතල ක්‍රියාවෙහි යෙදවීම, කාර්යයන් කිරීම සහ යුතුකම් ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඒ මණ්ඩලය, කමිටුව, සංගමය හෝ සංවිධානය, වෙනත් පොදු හෝ විශේෂ ලිඛිත විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ මණ්ඩලය, කමිටුව, සංගමය හෝ වෙනත් සංවිධානයන් විසින් ඒ විධාන ක්‍රියාවෙහි යෙදවිය යුතුය.

(ii) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩලවල, කමිටුවල, සංගම්වල සහ වෙනත් සංවිධානවල සහ දේපල කටයුතු සම්බන්ධයෙන් වූ වාර්තා, ගණන් සහ වෙනත් තොරතුරු තමාට අවශ්‍ය විය හැකි ආකාරයෙන් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඒ මණ්ඩලවලට, කමිටුවලට, සංගම්වලට සහ වෙනත් සංවිධානවලට කලින් කළ විධාන කළ හැකි අතර, ඒ මණ්ඩල, කමිටු, සංගම් සහ වෙනත් සංවිධාන ඒ හැම විධානයක්ම අනුව ක්‍රියා කළ යුතුව ඇත.

(iii) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩලවල, කමිටුවල, සංගම්වල සහ වෙනත් සංවිධානවල කටයුතු සියල්ලම හෝ ඉන් යමක් තමන් විසින් නියවය කරනු ලැබිය හැකි සුදුසු තැනැත්තෙකු විසින් විමර්ශණය කරන ලෙසත් අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කර හැකි අතර, එසේ නියම කරන ලැබූ කල්හි ඒ ඒ සෑම නියමයක්ම ක්‍රියාවෙහි යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි සියළුම පහසුකම් සැළැස්වීම සහ සියළුම තොරතුරු සැපයීම ඒ මණ්ඩලය, කමිටුව, සංගමය සහ වෙනත් සංවිධානයන් විසින් කළ යුතුය.

26. (i) මධ්‍යම පළාත නියෝජනය කරමින් මෙරටහි දී හෝ පිටරටහි දී පුස්තකාලයාධිපතිවරයෙකුට/කණ්ඩායමකට /පුස්තකාල කාර්ය මණ්ඩලවල සාමාජික කණ්ඩායමකට /උපදේශක මණ්ඩලවල සාමාජික කණ්ඩායමකට සහභාගිවීම සහ පාලනය සඳහා අමාත්‍යවරයාට නියෝග සැදිය හැක.

(ii) පළාත් පාලන ආයතන විසින් සැපයිය යුතු අවම පුස්තකාල පහසුකම් පිළිබඳ නියෝග සහ ප්‍රමිති පැනවීමට අමාත්‍යවරයාට හැක.

(iii) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහාත්, නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත හෝ නියෝග සැදීමට මේ පනතින් බලය දී ඇති සියළු කරුණු සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සැදිය හැකිය.

(iv) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එසේ පළ කරණු ලබන දිනයෙහි හෝ ඒ දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කර තිබිය හැකි, පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතුය. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් අනුමැතිය සඳහා මධ්‍යම පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු ලැබූ යම් නියෝගයක් එහි අනුමත නොකළ දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සැළකිය යුතු නමුදු ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතුය. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැළකෙන දින ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලැබිය යුතුය.

27. මේ ප්‍රඥප්තිය යටතේ පිහිටවනු ලැබූ පළාත් පුස්තකාල සේවා මණ්ඩලය, දිසා පුස්තකාල සේවා මණ්ඩලය, ප්‍රාදේශීය පුස්තකාල සේවා මණ්ඩලය, සාමාජිකයින්ට මධ්‍යම පළාතේ මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් විනිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ ප්‍රමාණයක් අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය. පාරිශ්‍රමික

28. පද සම්බන්ධයෙන් අනාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියේ " අමාත්‍යවරයා " යන්නෙන්, මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා අදහස වන අතර, " අමාත්‍යාංශයේ " යන්න ඒ අනුව තේරුම් ගත යුතුය. අර්ථ නිරූපනය

"ලේකම් " යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයය පැවැරෙන අමාත්‍යාංශයේ ලේකම් විය යුතුය.

" පුස්තකාල සේවා හා තොරතුරු සේවා " යන්නට අමාත්‍යාංශයේ ලේකම් විසින් මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පුස්තකාල සේවා සහ තොරතුරු සේවා වශයෙන් පිළිගනු ලබන ඕනෑම ආකාරයකට පුස්තකාල සේවා සහ තොරතුරු සේවා ඇතුළත් වේ.

මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධව අර්ථ නිරූපනයක දි සිංහල පිටපත, මුල් පිටපත ලෙස පිළිගත යුතු වේ.

03 – 432

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.